Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka

**SAMODHANA**

**Vol. 9, Issue II, (December) 2020**

*The Journal of Faculty of Social Sciences and Humanities*

# ශ්‍රී ලංකාවේ සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රමවේදය (Community correction system) සහ බන්ධනාගාර පුනරාවර්ථකයින්ගේ (Recidivists) ප්‍රවණතා

**ඊ. එම්. සමන්ත ඒකනායක**

සමාජීයවිද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

මිහින්තලේ

*Correspondence: em.samantha.e@gmail.com

Received: 14 October 2020

Accepted: 12 December 2020

## Abstract

Sri Lanka correspondingly used a community correction system, rehabilitation, and severe punitive methods to control the crimes but, convicted and recidivist offenders have regularly increased. In the last seven years, the average of convicted prisoners per year was 30,000 from 2009 to 2016, and 50% first offender 28.6% reconvicted, and 21.2% recidivists and in 2016 increased to 30.4% reconvicted and 26% recidivists. Hence, this study mainly focused on why reconvicted and recidivists increased while existing, community correction systems, rehabilitation, and judiciary severe punishments in the country. Thus, the main objective was to explore the causes of the increase of recidivists. This research is heavily drawn from criminological approaches and the deterrence theory. The study mainly based on official crime statistics and primary data collected through the Interviews, case studies, and case history form recidivists of Bogambara prison in Kandy. The study shows that less severity of punishment practice in prison, rejection of community or exclusion in re-socialization process, less opportunity for employment, labeling as criminals, minor offenders socializes to be grave criminals and delay of the

trial has been long-term caused for increasing reconvicted and recidivist offenders in contemporary.

**Keywords:** Crimes, Prision, Recidivist, community corrction, punishment

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අපරාධ හා බන්ධනාගාර සිරකරුවන් පිළිබඳ විවිධ අධ්‍යයනය සිදුකර තිබේ (Niriella,S (2010); Vidanapathirana, M and Ruwanpura, R.P (2018); Abeysirigunawardene J. (2000) එහෙත් එම අධ්‍යයන මගින් අපරාධවල පැහැදිලි අඩුවීමක් දැකගත නොහැකි බව අනාවරණය විය. එපමණක් නොව, රජය මගින් 'සිරකරුවන් නිවැරදි කිරීමේ ක්‍රියාවලිය' සඳහා විශාල පිරිවැයක් දැරුවද දෙවනවරට හා ඊට වැඩි අවස්ථා ගණනක් සිරගත වන පිරිසෙහි පැහැදිලි වර්ධනයක්ද පෙන්නුම් කෙරේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන වාර්තාවලට අනුව වසර 2009 සිට 2016 දක්වා කාල පරාසය තුළ වසරකට සිරගතවන්නන්ගේ සාමාන්‍ය ගණන සිරකරුවන් 30,000 ක් බව දැක්වේ. 2009 වසරෙහි සිරගත වූවන්ගෙන් 50% ක් පළමු වර සිරගතවන්නන් වේ. ඉතිරිය 28.6% ක් දෙවනවර සිරගතවන්නන් ලෙස හා 21.2%ක් පුනරාවර්තීවාදීන් (Recidivists) විය. මෙය 2016 දී පිළිවෙළින් 30.4% ක් හා 26% ක් වශයෙන් වර්ධනයක් දැකිය හැකිය (බන්ධනාගාර දෙපාර්තමේන්තුව, 2017).

ශ්‍රී ලංකාවේ මෙන්ම අනෙක් බොහෝ රටවලද සමාජ පාදක නිවැරදි කිරීමේ කාර්යභාරය නොහොත් වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීමේදී සමාජය පදනම් කරගත් නිවැරදි කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමවේදය පිළිබඳව අධ්‍යයන කළ පර්යේෂකයෝ ඒවායේ ඵලදායීතාව පෙන්වා දෙති (Boesen & Grupp, 1976; Smykla, 1981). විශේෂයෙන් පසුගිය දශක කිහිපය තුළ බොහෝ රටවල් අවධාරණය කර ඇත්තේ සමාජ නිවැරදි කිරීමේ වැඩසටහන් මගින්, වැරදිකරුවන් සමාජයට නැවත ඇතුළු වීමට සූදානම් වන නවෝත්පාදන හඳුන්වා දීම පිළිබඳවය (Ekstedt and Griffiths, 1988). එබැවින් බොහෝ රටවල සමාජය පදනම් කරගත් නිවැරදි කිරීම් වැඩි වැඩියෙන් භාවිත කිරීමෙන් ඇඟවෙන්නේ වැරදිකරුවන් සිරගත කළ යුත්තේ ඔවුන් භයානක වූ විට හා සමාජයට තර්ජනයක් වනවිට පමණක් බව බලධාරීන් දැනටමත් ඒත්තු ගෙන ඇති බවයි. සුළු වැරදිවලට වැරදිකරුවන් වූ සෙසු වැරදිකරුවන් සමාජයේම පුනරුත්ථාපනය කෙරෙනු ඇතැයි සැලකේ. බොහෝ අපරාධ විද්‍යාඥයියෝ සමාජය පදනම් කරගත් නිවැරදි කිරීම් ක්‍රමය, වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීමේදී වඩා හොඳ ක්‍රමයක් ලෙස පෙන්වා දෙති. එයට හේතු වන්නේ එය වඩා මානුෂීය, අඩු වියදම් සහිත සහ වැරදිකරුවන් සමාජයට නැවත සම්බන්ධ කිරීමෙහිලා වඩා සාර්ථක ක්‍රමයක් වන බැවිනි (Boesen & Grupp, 1976; Ekstedt and Griffiths, 1988).

බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් 'පරිවාස ක්‍රමය' හඳුන්වා දීමත් සමග සමාජ නිවැරදි කිරීම් ක්‍රමය ලංකාවේද ආරම්භ විය. වැරදිකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත 1944 නොවැම්බර් 16 දින බලාත්මක කරනු ලැබූ අතර පරිවාස සේවය 1945 මාර්තු 12 වන දින නිල වශයෙන් ආරම්භ කරන ලදී (Gunesekera, 1985). ලංකාවේ, "පරිවාස" හෝ වෙනත් වචනවලින් කිවහොත්, අධීක්ෂණය යටතේ වැරදිකරුවන් නිදහස් කිරීම බෞද්ධ දර්ශනයේ මූලයන් තුළින්

ගොඩනගා ඇත. එනම්, යම් සුළු වරදකට දඬුවම් පනවන විට 'පරිවාස කාලය' දඬුවමක් ලෙස හඳුන්වා දෙනු ලැබේ. නූතන අධිකරණය මගින් වැරදිකරුවන් සාමාන්‍ය සමාජයේ සිටියදීම ඔවුන්ට නැවත එම වැරදි සකස් කර ගැනීමට අවස්ථාවක් ලබා දෙයි. එමිල් ඩර්කයිම්ට අනුව සමාජය නවීකරණය වීමත් සමග අතීතයේ පැවති මර්ධනකාරී දඬුවම් ක්‍රම (Repressive law) මගින් මිනිසා ඉවත්ව තිබේ. ඒ සඳහා බලපෑ ප්‍රධාන සාධකය වන්නේ මිනිසා තාක්‍ෂණික ක්‍රියාවලිය හමුවේ විශේෂීකරණයට යොමුවීම බව 'ශ්‍රම විභජනය' නම් කෘතියෙහි ඔහු විග්‍රහ කරයි. එමෙන්ම එකී මර්දනකාරී දඬුවම් ක්‍රම වෙනුවට තත්කාලීන සමාජ 'පුනරුත්ථාපන නීතිය' (Resttituve law) කෙරේ යොමුව ඇති බවත් ඔහු තවදුරටත් දක්වා ඇත (Clarke, M. 1976).

පරිවාස අධීක්ෂණ කාල පරිච්ඡේදයකින්, වැරදිකරුවෙකුට වරදෙහි ස්වභාවය සහ වැරදිකරුගේ ස්වභාවය ඇතුළු සියලු තත්වයන් සමාලෝචනය කිරීමෙන් අනතුරුව පරිවාස කාලය අවසන් කළ හැකි බව පරිවාස ආඥා පනතේ සඳහන් වේ. උසාවියට පැනවීමට බලය ඇති වෙනත් දඬුවමක් වෙනුවට වරදකරුට / වරදකාරියට පරිවාස නියෝගයක් ලබා දිය හැකිය. සැකෙවින් කිවහොත්, ආඥාපනතට අනුව 'පරිවාසය' යනු තෝරාගත් වැරදිකරුවන්ට ප්‍රතිකාර කිරීමක්යැයි අර්ථ දැක්විය හැකිය.

1956 දී පරිවාස සේවාව, බන්ධනාගාර සේවයෙන් වෙන් කොට පරිවාස හා ළමා ආරක්ෂණ සේවා දෙපාර්තමේන්තුව යටතේ, ළමා ආරක්ෂණ සේවා සමඟ ඒකාබද්ධ කරන ලදී. පසුව පරිවාස සේවා වෙන් වෙන්ව ස්ථානගත කර ඇති හෙයින්, පරිවාස නිළධාරීන් උසාවියේ පෙනී සිටින්නේ ඔවුන්ගේ සේවය කැඳ වූ විට පමණි. එහිදී එම පරිවාස නිළධාරීන් විසින් වරදකරුවෝ පිළිබඳව පූර්ණ වාර්තාවක් උසාවියට ලබාදිය යුතු වෙති. නමුත් ඇතැම්විට එම පරිවාස නිළධාරීන්හට වැරදිකරුවන් සහ ඔවුන්ගේ පවුල් පිළිබඳ පුද්ගලික තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතා සහ බාධක මතුවන අවස්ථාද පවතින බව හඳුනාගෙන ඇත. අධිකරණය පනවන්නා වූ පරිවාස නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට මෙයද හේතු වී තිබේ. පරිවාස භාරයේ තබා ගැනීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සපුරාලන තුරු වරදකරුවන් අත්අඩංගුවේ තබා ගැනීම හෝ ඇප මත මුදා හැරීම කරනු ලැබේ. පරිවාස ක්‍රියා පටිපාටියේ කාර්යක්ෂමතාවය අඩාල කිරීමට මෙවැනි දුෂ්කරතා බලපාන බව මේ අනුව පැහැදිලි වේ. එබැවින් එහි ප්‍රතිඵලයක් වශයෙන්, උසාවිය සාමාන්‍යයෙන් වැරදිකරුවන්ට සිර දඬුවම් හෝ ඒ හා සමාන දඬුවම් ලබා දීමට කටයුතු කරන අතර එම පුද්ගලයින් නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ වීම වැළැක්වීමේ ක්‍රමයක් ලෙසද එය ක්‍රියාත්මක වේ. තවද ලංකාවේ දීර්ඝකාලීන සිරදඬුවම් ලබන සිරකරුවෝ, බලපත්‍රයක් මත නිදහස් වීමටද සුදුසුකම් ලබති. මෙම ක්‍රමය 1969 සිට ක්‍රියාත්මක ව පවතී. එහි මූලික අරමුණ වන්නේ වැරදිකරුවන් ඔවුන්ගේ දඬුවම් කාල සීමාව අවසන් වන තුරු සුබසාධන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කිරීමට සැලැස්වීමත් වරදේ ස්වභාවය පිළිබඳ වැරදිකරුවන් දැනුවත් කිරීමත්ය. අනතුරුව අදාළ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඔවුන් සමාජගත කිරීම සිදු කෙරේ. මෙම අදහස බටහිර ලෝකයේ පැරෝල් ක්‍රමයට (Parole system) සමාන වේ (Joan, P. 2003).

සමාජය පදනම් කරගත් නිවැරදි කිරීම් ක්‍රමයක් ලෙස 'බලපත්‍ර ක්‍රමය' (Licence system) ක්‍රියාත්මක වුවද බන්ධනාගාර ජනගහනය අඩු කිරීම සඳහා එය ප්‍රබල දායකත්වයක් නොදක්වන

බව මෙහිදී සඳහන් කළ යුතුය. මෙම වැඩසටහන යටතේ සෑම වසරකම ඒ සඳහා සුදුසුකම් ලබන්නේ සිරකරුවන් 30-40 ක් පමණක් බව සඳහන් වේ. පරිවාස, පැරෝල් වැනි සමාජ පදනම් කරගත් නිවැරදි කිරීම්වලට අමතරව, විකල්ප දඬුවමක් ලෙස සමාජ සේවා නියෝග පැනවීමට හැකි නීති කිහිපයක්ද ක්‍රියාත්මකව පවතී.

සමාජ සේවා නියෝගය යනුවෙන් අදහස් කරන්නේ ලංකා බන්ධනාගාරවල තදබදය අඩු කිරීම සඳහා භාවිත කරන ප්‍රාථමික යාන්ත්‍රණයකි. 1979 අංක (15) දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය මගින් සමාජ සේවා ක්‍රමය (The Society Service Order) අර්ථ දක්වා ඇත (The Code of Criminal Procedure Act No. 15 of 1979).

(අ) චූදිතයෙකු වරදකරු කිරීම මත සිර දඬුවමක් නියම කිරීම වෙනුවට, මෙතැන් සිට "සමාජ සේවා නියෝගයක්" ලෙස හැඳින්වෙන නියෝගයක් ඇතුළත් කළ හැකිය. එමගින් විත්තිකරුට, නම් කරන ලද ස්ථානයක නියමිත සේවාවක් කිරීමට නියම කරනු ලැබේ. එවැනි නියෝගයක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් රෙගුලාසි සකස් කර ඇත්නම් රාජ්‍ය හෝ රාජ්‍ය අනුග්‍රහය දක්වන ව්‍යාපෘතිය.

(ආ) මහේස්ත්‍රාත්වරයකු විසින් නියෝගය පැනවූ විට වසරකට අඩු කාලයකටත්, මහාධිකරණය විසින් නියෝගය ලබා දුන් විට වසර තුනකටත් අඩු කාලයකට නියෝගයේ කාල සීමාව සීමා වේ;

(ඇ) සමාජ සේවා නියෝගය යටතේ රඳවා සිටින වරදකරු, ව්‍යාපෘතියේ කළමනාකරණ නීතිරීතිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත්, එය අවලංගු කිරීමට සහ එවැනි සිර දඬුවමක් නියම කිරීමට නියෝගයට ඇතුළු වූ අධිකරණයට සුදුසු යැයි සිතන පරිදි; එය නීත්‍යානුකූල විය යුතුය.

(ඈ) සමාජ සේවා නියෝගය මගින්, ව්‍යාපෘතියේ කළමනාකරු හෝ අධීක්ෂණ නිලධාරියා විසින් වරදකරු වූ තැනැත්තාගේ පැමිණීම සහ වැඩ කිරීම පිළිබඳ වාර්තාවක් මාසිකව ඉදිරිපත් කළ යුතු අතර, සමාජ සේවා නියෝගය ක්‍රියාත්මක වන්නේද නැතහොත් ඊට අනුකූලද යන්න සඳහන් කරමින් එවැනි වාර්තාවක්, එවැනි ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අවසාන සහ තීරණාත්මක නිර්ණායකය විය යුතුය (අපරාධ නඩු විධාන සංග්‍රහය 02 වන පරිච්ඡේදය, උප වගන්තිය (18-1). කෙසේ නමුත් මෙම ක්‍රමය මගින් රජයට ප්‍රතිලාභ කිහිපයක් දැකිය හැකිය.

අ) අඩු පරිපාලන වියදම්;


ආ) වැරදිකරුගේ පවුලට හා සේවා පරිසරයට බාධා ඇතිවීම වැළැක්වීම;

ඇ) වැරදිකරුගේ ආත්ම අභිමානය ආරක්ෂා කිරීම; හා

ඈ) බන්ධනාගාරය තුළ ජනිත වන දුෂ්කරතා වළක්වා ගැනීම

සමාජ සේවා නියෝග මගින්, ස්වේච්ඡා සංවිධානවලට සමාජයේ පුනරුත්ථාපන වැඩසටහන් ස්ථාපිත කිරීමට හැකි වේ. මෙම වැඩසටහන් කැපී පෙනෙන ප්‍රගතියක් සහ

සාර්ථකත්වයක් පෙන්නුම් කර ඇති බවද සඳහන් වේ (UNAFEI 1986). සුළු වැරදිවලට වැරදිකරුවන් වූ වැරදිකරුවන් සහ නඩු විභාගයක් බලාපොරොත්තුවෙන් සිටින වැරදිකරුවන් මේ සඳහා යොමු කරවනු ලැබේ. පුනරුත්ථාපන වැඩසටහන් සෘජුවම භික්ෂූන් හා පූජකවරුන් යටතේ පවතින ආගමික ආයතන මගින් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන් සඳහා සමාජ හා මානසික සංවර්ධන ක්‍රියාකාරකම් ඇතුළත් වන අතර එමගින් වැරදිකරුවන් වෙනතකට යොමු කිරීම සිදු වේ. එහිදී භාවනාව තුළින් භක්තිය හා උද්යෝගය ඇති කිරීමට උත්සහ කරන අතර අපරාධවලින් වැළකී සිටීමට දිනපතා දිවුරුම්දීමද සිදු කෙරේ. ආගම හරහා වැරදිකරුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා කැපවී ඇති **සාමෝදය** සංවිධානයේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක වන ආකාරය හඳුනාගෙන ඇත. 1984 දී බෞද්ධ භික්ෂුවක් මහේස්ත්‍රාත්වරයකුගේ සහයෝගය ඇතිව මෙම සංවිධානය ආරම්භ කළ බව දැක්වේ. මෙම ආයතනයට පුනරුත්ථාපනය සඳහා වැරදිකරුවන් සහ රිමාන්ඩ් සිරකරුවන් යවනු ලැබේ. සාමෝදය සේවයේ ක්‍රියාකාරීත්වය පූර්ව යටත් විජිත සමයේ, බෞද්ධ විහාරස්ථානය සහ රජය අතර සම්බන්ධතාවයට අනුරූප ලෙසින් ක්‍රියාත්මක වේ. එහිලා අතීතයේදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉටු කළ එම කාර්යභාරයට සමාන කාර්යභාරයක් ඉටු කිරීමට වර්තමාන බෞද්ධ භික්ෂූන් වහන්සේලාද කැපවී සිටිති. පූර්ව යටත් විජිත සමයේ, රටේ නීතිය හා සාමය පවත්වාගෙන යාමට බෞද්ධ විහාරස්ථාන දායක විය. අතීත ලංකා සමාජයේ රාජ්‍ය පරිපාලනය ධර්මිෂ්ඨ ලෙස පවත්වා ගෙන යන ලෙස බෞද්ධ භික්ෂූන් වහන්සේලා පාලකයන්ට උපදෙස් දුන් අතර සුදුසු ජීවනෝපායන් සඳහා ජනතාව යොමු කිරීමෙන් නීතිය හා සාමය පවත්වා ගැනීමට උදව් කළහ.




**ප්‍රස්තාරය 1:**

**සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සඳහා වාර්ෂිකව යොමුකරන ප්‍රමාණය**

**මූලාශ්‍රය: Department of Prison 2014-2018**

වර්තමානයේ දේශපාලන කැරැලිකරුවන් වැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි යෙදෙන අය මෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් වැනි වැරදිකරුවන් රටට දැඩි තර්ජනයක් වී තිබේ. මේ සම්බන්ධයෙන්, 'සාමෝදය සේවය' ක්‍රියා කරන අතර වැරදිකරුවන් නීතිගරුක පුරවැසියන් බවට පත්කිරීමේ ක්‍රියාවලිය මගින් රජයට සහාය දක්වයි. මෙම පුනරුත්ථාපන වැඩසටහන පවත්වාගෙන යාම සඳහා අධිකරණය අමාත්‍යාංශය, ජාතික අන්තරායකර ඖෂධ පාලන

මණ්ඩලය, ජාතික තරුණ සේවා සභාව සහ පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම ආයතනයට පහසුකම් සපයා ඇත. කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සඳහා වාර්ෂිකව යොමුකරන ප්‍රමාණය, වාර්ෂිකව සිරගතවන්නන්ගේ ප්‍රමාණය හා සැසඳීමේදී එය 04% ට වඩා කුඩා සංඛ්‍යාවක් වේ. එබැවින් සිරගතවන්නන්ගෙන් විශාල ප්‍රමාණයක් දඬුවම් සඳහා යොමුව ඇත. පහත ප්‍රස්තාර සටහනෙහි සඳහන් වන්නේ පසුගිය වසර කිහිපයක සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සඳහා වාර්ෂිකව යොමුකරන ලද ප්‍රමාණයයි.

ශ්‍රී ලංකාවේ මෙම වැරදිකරුවන් විශාල පිරිසක් සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය, බන්ධනාගාර පුනරුත්ථාපන සහ දඬුවම් ක්‍රම අවසානයේ වාර්ෂිකව සමාජගත කෙරේ. මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ස්වභාවයේ නෛතික තත්වය විමර්ශනය කරන්නෙකුට එය සාර්ථක ක්‍රමයකැයි සිතිය හැකිය. එහෙත් එහි සාර්ථක, අසාර්ථකත්වය විද්‍යමාන වන්නේ වර්තමානය වන විට නැවත සිරගතවන සිරකරුන්ගේ ප්‍රමාණයට සාපේක්ෂවය. මන්ද, එහි පරමාර්ථය වැරදි පුද්ගලයින් නිවැරදිකරුවන් ලෙස සමාජගත කිරීම වන බැවිනි. පහත සඳහන් වන්නේ පසුගිය වසර කිහිපයක බන්ධනාගාරගත වූවන්ගේ ප්‍රමාණයයි.


**වගු අංක 1:**
**වාර්ෂිකව සිරගතවන්නන්ගේ ස්වභාවය 2006-2016**

| වර්ෂය | පළමු වැරදිකරුවන් | දෙවන වැරදිකරුවන් | දෙවතාවට වැඩි | දෙවන සහ වැඩි එකතුව |
|---|---|---|---|---|
| 2006 | 15114 | 8353 | 5265 | 13618 |
| 2007 | 14876 | 9670 | 6760 | 16430 |
| 2008 | 17362 | 9007 | 7197 | 16204 |
| 2009 | 19276 | 8792 | 9804 | 18596 |
| 2010 | 19531 | 7596 | 5001 | 12597 |
| 2011 | 11238 | 9912 | 5868 | 15780 |
| 2012 | 12528 | 8351 | 7512 | 15863 |
| 2013 | 14446 | 9204 | 7110 | 16314 |
| 2014 | 15020 | 7837 | 4731 | 12568 |
| 2015 | 13902 | 6391 | 3793 | 10184 |
| 2016 | 10482 | 7307 | 6271 | 13578 |

මූලාශ්‍ර: බන්ධනාගාර දෙපාර්තමේන්තුව 2017

උක්ත සඳහන් වගුවට අනුව දෙවන වරට හා ඊට වැඩි අවස්ථා ගණනක් සිරගත වන පිරිසෙහි පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කෙරේ. එනම් වසර 2009 සිට 2016 දක්වා කාල පරාසය තුළ වසරකට සිරගතවන්නන්ගේ සාමාන්‍ය අගය 30,000ක් වේ. 2009 වර්ෂය වන විට ඉන් 50% පළමුවර සිරගතවන්නන් ලෙස සඳහන් වේ. ඉතිරය 28.6% ක් දෙවනවර හා 21.2% පුනරාවර්තීවාදීන් (Recidivists) ලෙස සටහන් වේ. මෙය 2016 දී පිළිවළින් 30.4%ක් හා 26% ක් වශයෙන් වර්ධනයක් දැකිය හැකිය. සමස්ථයක් ලෙස එක්වතාවකට වඩා සිරගතවන්නන්

වසර 2016 වන විට 56.4% දක්වා ඉහළයාම මගින් ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන ක්‍රියාවලිය ප්‍රශ්නාර්ථයක් බවට පත්ව ඇති බව මනාව පැහැදිලි වේ. මේ තත්වය පහත සඳහන් ප්‍රස්ථාරය මගින් වඩාත් පැහැදිලි වේ.





**ප්‍රස්තාරය 2:**
**වාර්ෂිකව සිරගතවන්නන්ගේ ස්වභාවය 2006-2016**
**මූලාශ්‍ර: බන්ධනාගාර දෙපාර්තමේන්තුව - 2017**

යම් සමාජයක වාර්ෂික සිරගතවන්නන්ගෙන් වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ දෙවනවර හෝ ඊට වැඩි වාරගණනක් සඳහා ඇතුළත්වන වැරදිකරුවන් නම් එම සමාජයේ ක්‍රියාත්මක දඬුවම් ක්‍රමය හෝ පුනරුත්ථාපන ක්‍රමය සාර්ථකයැයි පිළිගත නොහැකිය. එබැවින් මෙම පර්යේෂණය දෙවනවර හෝ ඊට වැඩි වාරගණනක් සිරගතවූවන් ඇසුරින් ආනුභවිකව විමර්ශනය කෙරිණි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා අපරාධ විද්‍යාත්මක ප්‍රවේශයන් භාවිත කළ අතර නිවර්ථනීය න්‍යායාය (Diterrence theory) උපයෝගීත්වයෙන් විශ්ලේෂණය කෙරිණි. මෙම අධ්‍යයනය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ බන්ධනාගාර දෙපාර්තමේන්තු නිල සංඛ්‍යා ලේඛන සහ බෝග ම්බර බන්ධනාගාරය ඇසුරින් සසම්භාවි ලෙස තෝරාගන්නා ලද සම්මුඛ සාකච්ඡා සහ සිද්ධි අධ්‍යයන මගින් එකතු කරන ලද ප්‍රාථමික දත්ත පදනම් කරගෙන ය. මෙහිදී පර්යේෂකයාගේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ රට තුළ මරණ දඬුවම දක්වා ඇඩි දඬුවම් ක්‍රියාත්මක පසුබිමක දෙවතාවක් හෝ ඊට වැඩි වාරගණනක් සිරගතවීම කෙරේ පුද්ගලයන් පෙළඹවිම කෙරෙහි බලපානු ලබන හේතුසාධක කවරේද / යන්න පිළිබඳවය. මන්ද, ලෝකයේ ඕනෑම රටක 'දඬුවම' භවිත කරනුයේ පුද්ගලයින් දඬුවමට දක්වන බිය හේතුවෙන් ඉන් ඉවත්වීමට කටයුතු කරනවාය යන තර්කය පදනමෙනි. නිවර්ථන න්‍යාය සවිස්තරාත්මකව ඉදිරිපත් කරන බෙකෙට් සහ සැස්සන් (2000) ගේ උපකල්පනය වන්නේ යම් සමාජයක දඬුවම දෘඪ සහ නිශ්චිත නම් එහි අපරාධ පහළ අගයක් වාර්තා වන බවයි. එබැවින් මෙම න්‍යායාත්මක පර්යාවලෝකනය ඇසුරින් යථෝක්ත ගැටලුව විමර්ශනය කෙරෙහි අවධානය යොමුවිය.




**ප්‍රස්තාරය 3:**
**බෙකෙට් සහ සැස්සන් (2000) ගේ නිවර්ථන න්‍යාය**
**මූලාශ්‍රය: Beckett, K and Sasson, T (2000).The Politics of Injustice: Crime and Punishment in America (2 ed) Sage Publication, USA.**

පර්යේෂණ ප්‍රාථමික දත්ත රැස්කිරීම මහනුවර බෝගම්බර බන්ධනාගාරයේ සසම්භාවි ලෙස තෝරා ගන්නාලද දෙවනවරට හෝ ඊට වැඩි අවස්ථාවක් සිරගත වූ සිරකරුවන් ආශ්‍රයෙන් සිද්ධි අධ්‍යයන 12ක් හා සම්මුඛ සාකච්ඡා මගින් ප්‍රාථමික ගුණාත්මක දත්ත රැස් කරන ලදී. ප්‍රාථමික ගුණාත්මක දත්ත විශ්ලේෂණය තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය (Thematic analysis method) භාවිත කරන ලදී. එහිදී තේමාවන් හඳුනාගෙන පර්යේෂණ අරමුණු සපුරාලීම සඳහා සංවිධානය කර විශ්ලේෂණය කෙරිණි.

ද්විතීයික දත්ත එක්රැස් කිරීමේදී ලංකාවේ පුනරාවර්තන තත්ත්වය කෙරෙහි අවධානය යොමු කළේය. එහි දී නිල අපරාධ සංඛ්‍යා ලේඛන "දර්ශක" "සඟරා" "ලිපි" සහ පිළිගත් "ප්‍රකාශිත පොත්" ප්‍රධාන තොරතුරු ප්‍රභවයන් විය. පියවර දෙකක් යටතේ දත්ත විශ්ලේෂණය කළ අතර පළමු පියවර වන්නේ පුනරාවර්තනය වැඩි වීමට හේතු වන වඩාත් බලපෑම්කාරී සාධක හඳුනා ගැනීමය. දෙවන පියවර වශයෙන් පුනරාවර්තනය පාලනය කිරීම සඳහා ගත හැකි උපාය මාර්ග ජනනය කිරීම දැක්විය හැකිය.

## 3. දත්ත විශ්ලේෂණය

ලංකා සංදර්භය තුළ පුනරාවර්තනයට බලපාන ප්‍රධාන සාධක සහ එවැනි අභියෝගවලට හේතු හඳුනා ගැනීම සඳහා එකතු කරන ලද දත්ත විශ්ලේෂණය කරන ලදී. එබැවින් දත්ත විශ්ලේෂණයේදී තේමාවන් උත්පාදනය හා දත්ත අර්ථ නිරූපණය කිරීමේදී උද්ගාමී ප්‍රවේශයට අනුවර්තනය විය.

### 1). පුනර්-සමාජානුයෝජන ක්‍රියාවලිය (Re-socialization process) සහ සමාජ අපහරණය (Social exclusion)

මෙම අධ්‍යයනයේදී, පුනරාවර්තනය සඳහා හේතු වන විවිධ සාධක හඳුනාගැනීමට හැකි විය. එහි දී, සමාජ අපහරණය නොහොත් සමාජ බැහැර කිරීම  සහ පුනර් සමාජානුයෝජන

ක්‍රියාවලිය අතර සහසම්බන්ධය මේ සඳහා බලපාන ප්‍රධාන දර්ශකයක් විය. මෙම ක්‍රියාවලිය සමාජ ව්‍යුහය සමඟ නැවත ඒකාබද්ධ කිරීම සඳහා අපරාධකරුවන්ට බෙහෙවින් බලපායි.

**වගු අංක 2:**
**පුනර් සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා අපහරණයේ බලපෑම**

| සංකල්ප (Concept) | මාන(Diamenssions) | දර්ශක (Indicators) |
|---|---|---|
| සමාජ අපහරණය (Social Exclusion) | පවුලේ තත්වය | පවුල තුළ පිළිගැනීමේ මට්ටම<br>විවාහ තත්වය |
| | නිවාස තත්වය | නිවාස වර්ගය<br>සමාජ නිවාස සඳහා ප්‍රවේශය<br>නිවාසවල ගති ලක්ෂණ |
| | අන්තර් සම්බන්ධතා | සමිති/සමා.මි පිළිගැනීමේ මට්ටම<br>මිතුරන් පිළිගැනීමේ මට්ටම |
| | වෘත්තීය තත්ත්වය | වෘත්තීය තත්ත්වය<br>සුදුසුකම් මට්ටම<br>සුදුසුකම් අවස්ථා -<br>රැකියා වෙළඳ පොළ පිළිගැනීම |
| | ආයතන සමඟ සම්බන්ධතා | ආයතනික පිළිගැනීමේ මට්ටම |

**මූලාශ්‍ර : කර්තෘ - ක්ෂේත්‍ර දත්ත විශ්ලේෂණය**

අධ්‍යයනය මගින් හඳුනාගෙන ඇති පරිදි, බොහෝ අපරාධකරුවන්ගේ සමාජ ඒකාබද්ධතාවයට බාධා පමුණුවන සමාජ, ආර්ථික හා පෞද්ගලික අභියෝග රාශියකි. වැරදිකරුගේ සමාජ පරිසරය, ගෘහස්ථ ක්ෂේත්‍රය (පවුල) සහ වෘත්තීය පරිසරය තුළ බොහෝ බාධක පවතින බව හඳුනාගෙන ඇත. පුනර් සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා අපහරණයේ සංකල්පීය විශ්ලේෂණය කවරාකාරයෙන් බලපා තිබේදැයි පහත මාන සහ දර්ශක මගින් විද්‍යමාන වේ. යම් පුද්ගලයෙක් සිර දඬුවම හෝ පුනරුත්ථාපන ක්‍රියාවලිය අවසන් කිරීමෙන් අනතුරුව නැවත සමාජගතවීමේදී එම පුද්ගලයින් පවුල මගින්, නිවාස පරිසරය මගින්, අන්තර් සම්බන්ධතා ක්‍රියාවලිය, වෘත්තීය සහ ආයතනික අවස්ථාවන් අභිමුව අපහරණයට පත්වන බව හඳුනාගත හැකිය. මෙම අපහරණීය පසුබිම ඉවෂාහන්ගත්වයට තුඩුදීමත්, එමගින් ඇති වන කළහකාරීත්වය පුනරාවර්තනයට බලපාන ප්‍රධාන සාධකය ලෙස පෙන්වාදිය හැකිය.

**01 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... මීට පෙර මම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා හිටියෙ. මට මාස තුනක් හිරගෙදරදී දඬුවම් ලැබුණා. මම ගෙදර ගියවිට හැමෝම මාව සැක කරන්න පටන් ගත්තා. මම පිටතට යන විට පවා ඔවුන් අසන්නේ අදත් කුඩු පාවිච්චි කළාද කියලයි. ඇත්තටම මම ඒ දේවල් අත්හැරියා. ඒත් මම යාළුවෙක් එක්ක කතා කළත් ඒ අයත් මට දොස් පවරනවා. මගේ වැරැද්දක් නැතිව ඒ අය මට බැණ වැදුණා. ඒ නිසා මම හිතුවා මම කිසිම වැරැද්දක් නොකර නරක දේ අහන්නේ ඇයි කියලා ඉතින් දෙවනුව මම මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න පටන් ගත්තා......"

ඉහත සිද්ධි අධ්‍යයනයට අනුව වගඋත්තරකරු තමා මත්ද්‍රව්‍යයවලට ඇබ්බැහි වී ඇති බව හෙළි කරන ලදි. එම නිසා ඔහුට නීතියෙන් දඬුවම් කර තිබේ. නෛතික රාමුව සම්බන්ධයෙන් අපරාධයක් කර තිබේ නම්" දඬුවමක් තිබේ. එය නොවැළැක්විය හැකිය. නීතිය බලාත්මක කිරීමේ ක්‍රියාවලියේදී මෙම සිරකරු තම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සම්බන්ධයෙන් අදාළ ශාරීරික දඬුවමක් අත්විඳ ඇත. එහෙත් ඔහුගේ නීතිමය දඬුවමෙන් පසු ඔහුට තීරණාත්මක තත්වයට මුහුණ දීමට සිදුවේ. පවුලේ කාර්යයන් තුළ එය පුද්ගලයෙකුගේ අනාගතය තීරණය කරන සමාජයේ මූලික ඒකකය බවට පත්වේ. පවුලේ සාමාජිකයින්ගේ කාර්යභාරය සහ පවුලේ සාමාජිකයන් අතර ඇති සමාජ බැඳීම් අවබෝධකර ගැනීම මඟින් පුද්ගලයාගේ අනාගත අපරාධවලට සම්බන්ධ වීම සහ පශ්චාත් සිරගත වීමට සම්බන්ධ වීමේ හැකියාව පිළිබඳව පුරෝකථනය කෙරේ. මේ සම්බන්ධයෙන් ඔහුගේ පවුල  සහ සමාජය සමඟ නැවත ඒකාබද්ධ වීමට එම සිදුවීම ඔහුට අහිතකර ලෙස බලපා ඇත. පවුලේ සාමාජිකයන් අඛණ්ඩව සැක සහිතවීම" අනිසි පවුල් වාතාවරණය චර්යාත්මක වෙනස් කිරීම් සඳහා දෙමාපියන්ගේ අධීක්ෂණය නොමැතිකම සහ දෙමව්පියන් නොසලකා හැරීම අනාගත සාපරාධී හැසිරීම් සඳහා ඇතිවිය හැකි අවදානම් නිර්මාණය කිරීමට පුළුල් ලෙස බලපා ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස "අපේක්ෂා භංගත්වය" එකට වෙසෙන්නන් කෙරෙහි විශ්වාසනීයත්වය බිඳ වැටීම "අනාගත අවිනිශ්චිතතාව" පශ්චාත් සාපරාධීත්වයට සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබේ. එබැවින් බොහෝ විට මනෝවිද්‍යාත්මක උපකල්පිත න්‍යාය (Hypothesized theory) මගින් අවධාරණය කරනුයේ ධනාත්මක හා ධනවත් පවුල්වල පුද්ගලයන්ට යහපත් සමාජ සබඳතා සහ සංවිධානාත්මක ජීවන පසුබිමක් පවතින බැවින් සාපරාධීත්වයෙන් තොරවීමට ඔවුන්ට අවකාශ ඇති බවයි (Levine. M. 1971). එහෙත් දෙමව්පියන්ගේ වැරදි ප්‍රතිචාරාත්මක ක්‍රමවේදයන් මෙන්ම" පවුල් වාතාවරණය, පවුල තුළ එම පුද්ගලයන් නොසලකා හැරීම යටතේ හැදී වැඩුණු පුද්ගලයින් අනාගත සාපරාධී චර්යාත්මක ප්‍රවණතාවක් පෙන්විය හැකි බැව් මෙම න්‍යායෙන් ගැඹුරින් විග්‍රහ කරයි. මෙම සිද්ධාන්තයට අනුව මොවුන් නැවත සිරගතවීමට හේතු වී ඇත්තේ ඉච්ඡාභංගත්වය" ආනාරක්ෂාව වැනි පවුලේ මූලික ක්‍රියාකාරීත්වය නැතිවීමයි. එයට හේතුවන්නේ  පුද්ගලයන් තම පෞද්ගලික අනන්‍යතාව පවත්වාගෙන යන මූලික ස්ථානය පවුලයි වීමයි. එබැවින් පෞරුෂ සංවර්ධනය නැවත සකස් කිරීමේදී පවුලේ දායකත්වය නොමැතිකම අවසානයේ වරදට හේතු වේ. එමෙන්ම නිසි මඟ පෙන්වීම වෙනුවට අනවශ්‍ය සැකය" ගෘහස්ථය තුළ සාමාජිකයන් සහ ඥාතීන්ගේ  පිළිගැනීමේ මට්ටම  පහළ වැටීම මොවුන් පුනරාවර්තනයේ ගොදුරු බවට පත්වීමට බෙහෙවින් බලපා ඇත. පවුල් පමණක් නොව" වෘත්තීය පරිසරය" විශේෂයෙන්  පුද්ගලයා අයත්වන ප්‍රජාව සහ විවාහයද බන්ධනාග ාර පුනරාවර්තනය සඳහා සෘණාත්මකව බලපාන වෙනත් සාධක අතර ප්‍රමුඛ වේ.

**02 වෙනි සිද්ධි අධ්‍යයනය** ඃ

"... මට දරුවන් දෙන්නෙක් ඉන්නවා. මම මේ බන්ධනාගාරයට දෙවනිපාරට ආවේ මිනීමැරුමක් නිසා. මගේ බිරිඳගේ අනියම් සබඳතාවක් නිසා මම ඇයව මරා දැම්මා.  මම මගේ දඬුවම් කාලයෙන් වැඩිහරියක්  සම්පූර්ණ කරලා ඉන්නේ. මට නිදහස් වෙන්න තව ඇත්තේ අවුරුද්දක් විතර. ඒත් මගේ දරුවන් කෙලින්ම කියන්නේ අපේ ගෙදරට එන්න එපා කියලයි. ඒ අය විතරක් නෙවෙයි මගේ නෑයෝ හැමෝම මාව ප්‍රතික්ෂේපකරනවා. මම


දන්නවා මගේ අතින් වුන වැරැද්ද" මම ඒක කළේ ඇතිවුන කේන්තියට" ඒත් කිසිකෙනෙක් ඒ ප්‍රශ්නය මගෙ පැත්තෙන් බලන්නෙ නැහැ............. ඒත් ඉතිං මොකද කරන්නෙ ...දුකයි."

**03 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... මම කොළඹ ජීවත් වුණේ මගේ තාත්තා එක්කයි. තාත්තාට සල්ලි තිබුණා. ඒ වගේම ඔහු රළු පුද්ගලයෙක්" ඔහු බන්ධනාගාර ගතවෙලත් තියෙනවා. මටත් තාත්තා වගේ වෙන්න ඕන වූනා. ඒ නිසා මමත් මගේ යාළුවෙක් එක්ක මත්ද්‍රව්‍ය විකුණන්න එක්වුනා. මෙය මගේ දෙවන අවස්ථාව. පළමු වතාවට මට මගේ වෘත්තිය වෙනස් කිරීමට ඕන වුණත් කවුරුවත් මාව කිසිම රැකියාවකට බඳවා ගත්තේ නැහැ. ඔවුන් මට රැකියාවක් ලබා දීමට බය වුණා. ඒ නිසාම මම ආයෙත් ජීවත්වෙන්න පරන රස්සාවම කරන්න හිතුවා. වෙන ජීවත්වෙන්න ක්‍රමයක් නැති නිසා. මම උසස් පෙළත පාස් කෙනෙක්...... "

පූර්වෝක්ත සිද්ධි අධ්‍යයනයන්ට අනුව සෑම සාපරාධී හැසිරීමක්ම ඔවුන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියට අහිතකර ලෙස බලපා ඇති අතර 03 වෙනි සිද්ධි අධ්‍යයනය අනුව වැරදිකරුගේ සාපරාධී ක්‍රියාකාරකම් ඔහුගේ දරුවන්ගේ අනාගත ජීවිතයට බාධාවක් වී ඇති බැව් විද්‍යමානය. පියාගේ අපරාධකාරී චර්යාව හේතුවෙන් ඔවුන්ගේ සබඳතා බිඳ වැටී ඇත. එබැවින් ඔහුට තම දරුවන් හා එක්ව වාසය කිරීමට නොහැකි වී ඇත. විශේෂයෙන් ඔහුගේ අපරාධකාරී චර්යාව ඉගෙනුම් න්‍යායචාරීන් පෙන්වාදෙන ආකාරයට එය "සම්ප්‍රේෂණය" බව පැහැදිලිය. එමෙන්ම ඔවුන්ගේ සාපරාධී ක්‍රියාකාරකම් හේතුවෙන් පවත්නා රැකියා වෙළඳපොළ මගින්ද ඔවුන් අපහරණයට ලක්ව තිබේ. විශේෂයෙන් වර්තමාන සමාජ ව්‍යූහය තුළ හැසිරීම් නැවත ගොඩනැංවීමට අසීරුබව එවැනි සාධක මගින් මනාව පැහැදිලිවේ. අපරාධකරුවන් සඳහා වන සමාජ ප්‍රතිචාරය ඔවුන්ගේ පුනරාවර්තනයට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳ සිව්වන සිද්ධි අධ්‍යයනයෙන් මැනවින් අවබෝධ කොටගත හැකි වේ.

සමාජ සම්මුතීන් මධ්‍යයේ මෙම තත්වය පුළුල් ලෙස බලපා ඇත. මන්ද "එවැනි පුද්ගලයින්හට පිළිගැනීමක් නොමැති අතර සමාජය මෙම පුද්ගලයින් ගැන පුරෝකථනය කරයි. එබැවින් රැකියා අවස්ථා සඳහා ප්‍රවේශය නොමැතිකම" නව සමාජ සබඳතා ගොඩනගා ගැනීම සඳහා පිළිගැනීමක් නොමැතිකම සහ සමාජ ප්‍රවේශයේදී දිගු කාලීනව ප්‍රතික්ෂේප වීම පුනරාවර්තනවාදීන් ප්‍රවර්ධනයට හේතු වී තිබේ. තවද පීඩන න්‍යාය (Strain theory) සහ සමාජ ඉගෙනුම් න්‍යාය (Social learning theory) මගින් අපරාධකාරී හැසිරීම හඳුනා ගැනීම සඳහා මානයන් ලබා දී ඇත. 'සාපරාධීත්වය' සිදුවන්නේ සමාජ ව්‍යූහාත්මක බලවේගවල ප්‍රතිඵලයක් ලෙස බව පීඩන න්‍යාය පෙන්වා දෙන අතර එම පීඩනයෙන් ඉවත්වීමට දරන උත්සහයක ප්‍රතිඵලයක් ලෙස සාපරාධීත්වය සිදු වන බව ඔවුහු පෙන්වා දෙති (Featherstone, R. & Deflem, M. 2003). සමාජ ඉගෙනුම් න්‍යාය 'සාපරාධීත්වය' සමාජයෙන් උගත් හැසිරීමක් ලෙස පිළිබිඹු කරයි (Bandura, A. 1977). එබැවින් මෙම අවස්ථා දෙකේදීම 03 සහ 04 මගින් පුනරාවර්තනය වැඩි කිරීම සඳහා වන සමාජ බලපෑම පෙන්නුම් කරයි. සමස්තයක් ලෙස විග්‍රහකර බැලීමේදී ලාංකේය සමාජයේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සහ පුනරාවර්තනයේ ක්‍රියාකාරීත්වය පහත සඳහන් රූපසටහන ඇසුරින් විශ්ලේෂණයකර දැක්විය හැකිය.



**රූපසටහන 1:**
**ශ්‍රී ලංකාවේ පුනරුත්ථාපන ක්‍රියාවලිය සහ පුනරාවර්ථනයේ ක්‍රියාකාරීත්වය**
**මූලාශ්‍රයඃ කර්තෘ - ක්ෂේත්‍ර අධ්‍යයනය**

## 2.) බන්ධනාගාර පුනරාවර්ථනය සහ සමාජ-සංස්කෘතික අර්ථකථන

මිනිසුන්ගේ හැසිරීම් මත පදනම් වූ වෙනස්කම් සමාජ හා සංස්කෘතික සාධක සමග බෙහෙවින් සම්බන්ධ වේ. සෑම කෙනෙකුම ජීවත්වන සමාජයේ විවිධ ආකාරයේ විශ්වාසයන් සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් "සිරිත් විරිත්" භාෂාමය රටාවන් සමස්තයක් ලෙස විවිධ වූ සංස්කෘතික සංදර්භයන් දැකිය හැකිය. ඒවා යම් ආකාරයකට සාපරාධි චර්යාවන් කෙරෙහි ධනාත්මකව හෝ සෘණාත්මකව බලපවත්නා ඒවා විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස එම සාමජයන් තුළින්ම සමාජ සම්මතයන්ට ගරුකරන්නන් පිළිගන්නා අතර සම්මතයන්ට එරෙහිවන්නන් වැරදිකරුවන්" අපරාධකරුවන් ලෙසින් ලේබල් (Labaling theory) කිරීමත් අනතුරුව ඔවුන් පූර්ණ අපරාධකරුවන් ලෙසින් සමාජගත වීමත් සිදු වේ (Johannes, K. 1977). මෙම සංස්කෘතික පර්යාවලෝකනය තුළ අපරාධකරුවන් අවාසනාවන්ත පුද්ගලයන් ලෙස සලකනු ලබන අතර ධනාත්මක සමාජ සංචලතාව සඳහා අවශ්‍ය කෘත්‍ය සමාජය මගින් ඉටුනොවේ. බොහෝ සමාජ සංස්කෘතීන්වල" විශේෂයෙන් අගතිය "වෙනස් කොට සැලකීම" අපගාමී චර්යාත්මක පුද්ගලයින් සමාජයෙන් අපරාධකරුවන් බවට පත්වීම කෙරෙහි හේතුවේ. ලාංකේය සංස්කෘතියේ යමෙක් වරදක් කළ අවස්ථාවක එය නිවැරදි කරගැනීම සඳහා එම පුද්ගලයාට අවකාශයක් ලබානොදෙන ස්වරූපයක් නිර්මාණය වී තිබේ. මෙම තත්වයන් ඕනෑම සමාජයක අපගාමී චර්යා" අපරාධ චර්යා දක්වා ප්‍රවර්ධනයට හේතු සාධක වේ' අපරාධකරුවන් අභිමුව සමාජය ක්‍රියාත්මක වන ස්වරූපය මෙවැනි සාධක මඟින් මනාව පැහැදිලිවේ. එම පුද්ගලයින් ලේබල් කිරීම සඳහා සමාජය විවිධාකාරයෙන් අන්වර්ත නාම භාවිත කරන්නා වූ ආකාරයද දැකිය හැකිය. විශේෂයෙන් කුඩුකරයා" ගංජකාරයා" මිනීමරුවා" හොරා" බේබද්දා" සහ රස්තියාදුකාරයා යන වචන මෙම පුද්ගලයාගේ ආත්ම අභිමානය හීන කිරීමට සෘජුවම හේතු වන අතර ස්ත්‍රී / පුරුෂ සමාජභාවයකින් තොරව මෙම අපකීර්තිය හා ආන්තිකකරණයට (Exclusion) දැඩි ලෙස මේවා භාවිතකරනු ලැබේ. අවසානයේදී මෙම පුනරුත්ථාපනය වූවන් සමාජානුයෝජනයෙන් ප්‍රතික්ෂේප වීමට මෙවැනි සාධකද හේතු වන ආකාරය පැහැදිලි වේ. මෙම සමාජ විසින් සමහර

අවස්ථාවල එම පුද්ගලයා පමණක් නොව මුළු පවුලම මෙම ආන්තිකකරණයට ගොදුරු කරනු දැකිය හැකිය (Parent, F.) Lewis, B. 2002). එබැවින් ලාංකේය සමාජයේ සංස්කෘතිය මඟින් කරනු ලබන මෙම ලේබල් කිරීම හා අපහරණය බන්ධනාගාරවල පුණරාවර්ඃකයින් වර්ධනය සඳහා දැඩිව බලපා ඇති බව විද්‍යමානය.

**08 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... මගේ සමහර යාළුවෝ කිව්වා" "කරුණාකර මට කතා කරන්න එපා" මොකද අපේ දෙමව්පියන් කැමති නෑ ඔයාට කතා කරනවාට" කියලා" ගමේ ක්‍රීඩා සමාජයේ මගේ සමහර හොඳම යාළුවෝ පවා මා දිහා බැලුවෙවත් නැහැ. දවසක් මම එයාලත් එක්ක බලෙන්ම වගේ කතා කළා. ඒ වෙලාවේ එයාලා කීවේ මාත් එක්ක කතා කළොත් එයාලටත් ප්‍රශ්න ඇතිවෙන්න පුලුවන් කියලා. ඒ නිසා ඒ අයත් එක්ක කඃකරන්න එපා කියලා......"

**10 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... අපේ පවුලේ අය පවා මාව සලකන්නේ බරක් විදියටයි. ඔවුන් නිතරම කියනවා මම ඔවුන්ගේ ගෞරවය විනාශ කළා කියලා. මගේ තාත්තා කියනවා මගේ මල්ලීව මාත් එක්ක තියාගන්න බයයි කියලා. මොකද එයාලා හිතනවා මම මගේ සහෝදරයාව නොමඟ යවනවා කියලා. ඒ නිසා මම මගේ ගෙදරින් පිට වෙනම තැනක" බෝඩිමකයි හිටියෙ. එහිදි මටම මාව පාලනය කරගන්න බැරිව ආයෙත් හිරේට එන්න උණා....."

සිද්ධි අධ්‍යයන 08 සහ 10 විභාග කිරීම මඟින් බන්ධනාගාර පුනරාවර්තින් සඳහා ලාංකේය සංස්කෘතිය කවර බලපෑමක් ඉටුකරන්නේද යන්න තේරුම් ගැනීම අපහසු නොවේ. සමාජ සහභාගීත්වය සීමා කිරීමට හේතු වන්නේ සමාජය විසින් ලබා දී ඇති සංස්කෘතික ප්‍රතිමාන හා ආචාරධර්ම බව මේ අනුව පැහැදිලිවේ. සමාජ ව්‍යුහය (Social structure) පිළිබඳ විග්‍රහ කරන ඉගෙනුම් න්‍යායාචාර්යවරු" නව පරම්පරාව අපචාරාත්මක හෝ අපරාධාත්මක චර්යාවන්ට ගොදුරු වීමේ අවධානමක් පවතින බව පෙන්වා දෙති. එමෙන්ම සමාජ බැහැර කිරීමේ න්‍යායට අනුව" සමාජ" ආර්ථික" දේශපාලන හා සංස්කෘතික වැනි සෑම ක්ෂේත්‍රයන් ඔස්සේම පුනරාවර්ඃකයින් සමාජයෙන් බැහැර කිරීම පැහැදිලිව දැකිය හැකිය. මෙමගින් ඔවුන්ගේ සමාජ ක්‍රියා සහ සමාජ අන්තර් ක්‍රියා සීමා කර ඇත. එමගින් ඔවුන් තුළ ඇති වන ඉච්ඡාභංගත්වය සෘජුවම බන්ධනාගාරවල පුනරාවර්ඃකයින් ප්‍රවර්ධනයට හේතු වේ.

යථෝක්ත සාධකයන්ට අමතරව පුද්ගලයන්ගේ සාපරාධී හැසිරීම්වලට බලපාන ප්‍රධාන හේතු වන්නේ යටිතල පහසුකම් සහ මානසික සාධක බලපාන බව හඳුනාගත හැකිය. මන්දයත්" පුනරාවර්තීවාදීන්ගෙන් බොහෝ දෙනෙක් සාපරාධී පෞරුෂය වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් මුහුණදෙන භෞතික හා අභෞතිය සංස්කෘතික පරිසරය සෘණාත්මකව ලෙස බලපාතිබේ. අධ්‍යයනය මඟින් හඳුනාගත් පරිදි අපේක්ෂා භංගත්වය" කාංසාව" සමාජ හුදකලාව" කොන් කිරීම" ලේබල් කිරීම" සහ සමාජ අන්තර් ක්‍රිකාරීත්වය දුර්වලවීම සංස්කෘතික සංදර්භය ගොඩනගන සාධකයන් වන බැවිණි.

### 3.) පරිපාලන කාර්ක්ෂමතාව (Adminstrative efficiency) සහ දඬුවමෙහි නිශ්චිතතාව හා දෘඪතාව (Certainty and severity)

සමාජ සන්දර්ර්භය තුළ පුනරාවර්තකයින් සමජයයෙන් අවම කිරීමට හෝ බැහැර කිරීරීමට නොහැකි වීම සඳහා බලපාන තවත් සාධක වශයෙන් නීතිය ක්‍රියාත්මක කරවීමේ අකාර්ර්යක්ෂමතාව සහ දඬුවමෙහි නිශ්චිතාව හා දෘඪතාව දක්වාලිය හැකිවේ. මෙහිදී හඳුනා ගැනීමට හැකි වූ ප්‍රධාන කරුණක් වූයේ නඩු විභාග වීමට වසර ගණන් ගතවීම තුළ එම චූදිතයින් ඊට වඩා දරුණු අපරාධ ලෙසින් සැලකෙන ලිංගික අපරාධ, මිනීමැරුම් සහ මත්ද්‍රව්‍ය වැනි අපරාධ සඳහා යොමු වී ඇති බවය. එමෙන්ම නඩුවිභාග කාලසීමාව තුළ ඇපමත නිදහස් වූවන්ද වෙනත් අපරාධයන් සඳහා යොමුව ඇති ආකාරය හඳුනාගත හැකි විය. තවද පුද්ගලයින් නැවත සිරගතවීමට නැතහොත් පුනරාවර්ථයින්වීම කෙරෙහි දඬුවමෙහි තිබෙන ලිහිල්භාවය මෙන්ම දඬුවමෙහි පවත්නා අවිනිශ්චිතතාවයද බලපාන බව තහවුරුවිය. ශ්‍රී ලංකාවේ දරුණු අපරාධ විෂයෙහි මරණ දඬුවමද ක්‍රියාත්මක වන රටකි. මරණ දඬුවම ක්‍රියාත්මක නැතත් ප්‍රධාන අපරාධ ත්‍රිත්වයක් වෙනුවෙන් එනම් මිනීමැරුම්, මත්ද්‍රව්‍ය ජාවාම් සහ ස්ත්‍රී දූෂණ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය සහ මහාධිකරණය මරණ දඬුවම දෙනු ලබයි. එහෙත් 1976 ජූනි 23 දින සිට රට තුළ මෙම දඬුවම ජීවිතාන්තය දක්වා ලබා දෙන සිරදඬුවමක් ලෙස ක්‍රියාත්මක වෙමින් තිබේ. එහෙත්, එනයින් ගත්කල ලාංකේය සමාජය තුළ "දඬුවම" යන්න දෘඪ එකක්යැයි පිළිගැනේ. එහෙත් නිවර්ථන න්‍යායාචාර්යවරුන් දඬුවම නිවැරදිව ක්‍රියාත්මක කිරීම තුළ වරදකරු පමණක් නොව සමස්ථ සමාජයද වරදින් මුදවාගත හැකිබව පෙන්වා දෙයි. එනමුත් ලංකා සමාජය විෂයෙහි මෙම තත්වය නිවැරදි නොවන බව සිරගතවන පුනරාවර්තකයින් සංඛ්‍යාවෙහි ඇති වී ඇති වර්ධනය මගින් තහවුරු වේ.

**09 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... මම මීට පෙර සිරගත වූයේ මිනී මැරුමකට උත්සහ කිරීමට චෝදනා ලබලා. ඇත්තටම මම එවැනි දෙයක් කළේ නැහැ. මගෙ හිත දන්නවා ඒක. ඒත් මට ඒ වගේ චෝදනාවක් කරලා තමයි මාව හිරේ දැම්මේ. ඇත්තම කතාව මම ඒ පවුලේ ගැහැණු ළමයෙක් සමඟ යාළු වුන නිසා මට දීපු දඬුවම. ඇත්තටම මම දැන් ඇවිත් ඉන්නෙ මම ඒක ඇත්තටම කරලා. මට මරණ දඬුවම නියමවෙලා තමයි මේ පාර ආවේ. මේකෙ දඬුවම කියන්නෙ කාලා බීලා මේකට වෙලා ඉන්න එකයි.. .........කලින් සැරේ හිටියට පස්සෙ හිරගෙට තිබ්බ බය ඇත්තටම නැතිවුණා........".

**11 වෙනි සිද්ධි අධ්‍යයනය :**

"... මං හිරගෙදරට ආවේ දෙවනි පාරට. කලින් වතාවක් ඇවිත් හිටියා අවුරුදු දෙකකට ගමේ ඇතිවුන ආරවුලක් නිසා. ඉන්පස්සෙ ගමේ හොඳින් හිටියා. හැබැයි මම කලින් හිරේට ආවේ මගෙම වරදක් නිසා නෙවෙයි කියලා ගමම දන්නවා. ඉතින් ගමේ අය මට වෙනසක් කළේ නැහැ. ඇත්තටම මම හොඳින් හිටියා. හැබැයි ගමේ මුදලාලියා කාටත් එපාකරපු මිනිහෙක්. හුඟක් අයට කරදර කරනවා. දවසක් මම කඩේගාව ඉද්දි අහිංසක කොල්ලෙකුට ගැහැව්වා. වරදක් තිබුනෙත් නැහැ. මට කේන්ති ගියපාර මම වැටේ ලීයක් ගලවලා මුදලාලියාට ගැහැව්වා. මිනිහා දවස් දෙකකට පස්සේ ඉස්පිරිතාලෙදි මැරුණා.

මට හිරේ යන්න බයනැහැ............ගමේ අය දන්නවා මම කවුද කියලා.........මට මරණ දඬුවම නියමවුණා........... ගමේ හැමෝම වගේ එනවා මාව බලන්න........මම හිතන්නෙ මම ගමට හොඳක් කළේ කියලා............"

ඕනෑම පුද්ගලයෙක් දඬුවමට බියවිය යුතුය. එහෙත් මෙහි ස්වභාවය දඬුවමක් ලද පුද්ගලයින් පවා දඬුවමට බිය පහව ගොස් ඇති ස්වරූපයකි. දඬුවම යනු පුද්ගලයෙකු කායික හෝ මානසිකව ලබන වේදනාකාරී තත්වයකි. එහෙත් සිරමැදිරියේදී ඔවුහු කායික වශයෙන් පීඩනයක් නොලබති. බරපතල වැඩ සහිත සිරකරුවෝ ද එහිදී එවැනි කායික දඬුවමක් නොලබති. එබැවින් පළමුවරට මෙහි පැමිණෙන අපරාධකරුවන් දෙවනවර මෙහි පැමිණීමට බියක් නොදක්වන ස්වභාවය විද්‍යමාන විය. දෙවනවර හෝ ඊට වැඩි වාර ගණනක් සිරගතවීම කෙරෙහි මොවුන් ජීවත් වන සංස්කෘතික සංදර්භයක් බලපාන බව මේ අනුව පැහැදිලි විය. මේ පසුබිම ලාංකේය සමාජයේ පුණරාවර්ථකයින්ගේ ප්‍රමාණය ඉහළයාම කෙරෙහි බලපා ඇති බව හඳුනාගත හැකි විය.

## 4. නිගමන සහ නිර්දේශ

මෙම අධ්‍යයනයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ රට තුළ දැඩි දඬුවම් ක්‍රම හා සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලියක් (Community correction system) ක්‍රියාත්මක වන පසුබිමක බන්ධනාගාර පුනරාවර්ථකයන් වැඩි වූයේ මන්ද? යන ප්‍රශ්නයට හේතු ගවේෂණය කිරීමට සහ එය පාලනය හෝ එම ඉහ ළ යෑමේප්‍රමාණය අවමකර ගැනීම සඳහා කවර උපක්‍රමයන් යොදාගත හැකිදැයි නිරීක්ෂණය කිරීම උදෙසාය. මෙම පර්යේෂණය සඳහා අපරාධ විද්‍යාත්මක ප්‍රවේශයන් භාවිත කළ අතර නිවර්ථනීය න්‍යාය උපයෝගීත්වයෙන් විශ්ලේෂණය කෙරිණි. මෙම ආනුභවික පර්යේෂණය මඟින් මේ තත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක කිහිපයක් පර්යේෂකයා විසින් අනාවරණය කරන ලදි.

ඒ අනුව බන්ධනාගාරයේදී ලබන දඬුවමෙහි බරපතලකම ප්‍රායෝගිකව හීනවීම, දඬුවමෙන්, පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් හෝ සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව සමාජ හා නෛතික පිළිගැනීමක් සමාජ සංස්කෘතික සංදර්භය තුළ ස්ථාපිත නොවීම, ප්‍රජාව විසින් අපහරණයට ලක්කිරීම, රැකියා අවස්ථා නොලැබීම, අපරාධකරුවන් ලෙස ලේබල්වීම, සුළු වැරදිකරුවන් බරපතළ අපරාධකරුවන් ඇසුරෙන් බන්ධනාගාර සංස්කෘතිය තුළ සමාජානුයෝජනය වීම සහ නඩු විභාග ප්‍රමාද වීම, පුනරාවර්ථන වැරදිකරුවන් වැඩි කිරීම සඳහා දිගු කාලීනව බලපානු ලබන හේතු වී තිබේ.

එබැවින් අපරාධකරුවන්ගේ දඬුවම්වල නෛතිකව පවතින ස්වභාවය ඒ අයුරින්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම මඟින් දඬුවමෙහි දෘඪබව හා නිශ්චිතබව තහවුරු කළයුතු වේ. දෙවනුව සමාජ පාදක නිවැරදි කිරීමේ ක්‍රියාවලිය සහ පුනරුත්ථාපන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීත්වය විමර්ශනයකොට නැවත කාලීනව ප්‍රතිව්‍යූහගත කිරීම කෙරේ අවධානය යොමුවිය යුතුය. තෙවනුව ඔවුන් සමාජගත කිරීමේ ක්‍රියාවලියට විශේෂ අවධානයක් ලබාදිය යුතුයැයි යෝජනා කෙරේ. ඒ මන්දයත් මෙම ක්‍රියාවලිය තුළ පසුවිපරම් දුර්වලවීම මේ කෙරෙහි බලපා ඇති ප්‍රධානම සාධකය ලෙස විද්‍යමාන වන බැවිනි. එබැවින් සමස්ථයක් ලෙස ශ්‍රී ලංකාවේ සිරකරුවන්ගේ

දඬුවම් හා නිවැරදි කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාකාරීත්වය ප්‍රතිව්‍යූහගත කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුයැයි යෝජනා කරන්නේ එමගින් බන්ධනාගාර පුනරාවර්ථකයින්ගේ වර්ධනය අවම කළහැකි බව විද්‍යමාන වන බැවිනි.

## References


Abeysirigunawardene J. (2000), Overcrowded prisons and present practices and experience in relation to community-based alternatives to incarceration. www.unafei.or.jp/english/pdf/RS_No79/No79_ 32PA_Abeysirigunawardana.pdf

Ahmad, S. (1997), criminology: problems and perspectives, Lucknow: Eastern book, 183.

Bandura, A. (1977). Social learning theory. Englewood Cliffs, N.J: Prentice Hall.

Beckett, K and Sasson, T (2000).The Politics of Injustice: Crime and Punishment in America (2 ed) Sage Publication, USA.

Boesen & Grupp, (1976) Community-Based Corrections: Theory, practice, & Research Tapa blanda , Amazon.

Clarke, M. (1976). Durkheim's Sociology of Law. British Journal of Law and Society, 3(2), 246-255. doi:10.2307/1409819

Ekstedt and Griffiths, (1988) Canadian Corrections: Policy and Practice North of 49°

School of Criminology. Simon Fraser University, Burnaby, British Columbia, Canada

Featherstone, R. & Deflem, M. (2003). "Anomie and Strain: Context and Consequences of Merton's Two Theories." Sociological Inquiry 73(4):471-489.

Gómez, a. I. (2017). Individual and structural factors affecting recidivism: the role of prisoners, prisons and places in the chilean context.

Gomperz T. (1905).The main objective of punishment is to reform the criminal. Greek thinker, 3, London: John Murray, 251, quoted from Sethna M.J. (1971), Society and the criminal, Melbourne: The Law Book Company, 240.

Joan Petersilia, (2003). When Prisoners Come Home: Parole and Prisoner Reentry. Oxford: Oxford University Press.

Johannes Knutsson (1977). Labeling Theory a critical examination, Scientific Reference Group Stockholm, Sweden.

Karunaratne, N. (retrived 05/11/2020). World factbook of criminal justice systems : sri lanka.

Ksenija Butorac, D. G. (2017). The challenges in reducing criminal recidivism .

Kuruppu, G. (05/11/2020). Current Issues in Correctional Treatment and effective Countermeasures.

Levine, Marvin (1971). "Hypothesis theory and nonlearning despite ideal S–R-reinforcement contingencies". Psychological Review. 78 (2): 130–140

Mc Clean and Wood (1969). Criminal justice and treatment of offenders, London: Sweet and Maxwell, 142

Merton, R.K. (1957). Social Theory and Social Structure, rev. ed. New York: Free Press.

Niriella, S. (2010) Effective prison rehabilitation system: Special reference to Sri Lanka US-China Law Review, Volume 7, No.3 (Serial No.64)

Sherry, L.S. (2020). Labeling theory, Encyclopædia Britannica

Smykla,J.O ( 1981). Community-based Corrections: Principles and Practices, Macmillan

Sudershan Pasupuleti, E. G. (2009). Crime, Criminals, Treatment, and Punishment An Exploratory Study of Views Among College Students in India and the United States. Journal of Contemporary Criminal Justice, 131-147.

Parent, F., & Lewis, B. (2002). Social Exclusion: A Useful Concept for Applied Sociology in the United States? Journal of Applied Sociology, 19(2), 100-123.

Perers, E. (access date: 03/10/2020). A study of criminal recidivism in sri lanka compared to norway .

Prison Statistics of Sri Lanka, Vol. II (2017). Colombo: Department of Prisons, Sri Lanka.

Ranaweera, M. D. (2018). A Study on the Factors Related to Recidivism of the Juvenile Delinquency in Sri Lanka.

Robert D. Hansner, (2010). Community Corrections. Los Angeles: Sage publication.

UNAFEI (1986) United Nations Asia and Far East Institute for the Prevention of Crime and the Treatment (Newsletter).

Vidanapathirana, M and Ruwanpura, R.P (2018) Correction methods available for the convicts in Sri Lanka compared with American methods of correction Medico-Legal Journal of Sri Lanka, 2018;6(2)